**උහන ප්‍රාදේශිය සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරිම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 ජුලි 02 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 ජුලි 03 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 සැප්තැම්බර් 21 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට උහන ප්‍රදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

වැය ලේඛණයට අනුව සමාලෝචිත වර්ෂයට අදාල වැටුප් හා දීමනා වියදම රු.16,329,747 ක් වූවද, ආදායම් හා වියදම් ගිණුමේ රු.15,827,327 ක් ලෙස දක්වා තිබූ බැවින් සමාලෝචිත වර්ෂයේ වියදම රු.502,420 ක් අඩුවෙන් දක්වා තිබුණි.

#### 1.3.2 නීති, රීති,රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට අනුකූල නොවීම්.

පහත සඳහන් නීති,රීති,රෙගුලාසිවලට හා කළමණාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති,රීති,රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| **(අ) ප්‍රදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාව** | |
| රීති 153 | ආදායම් හිඟ මුදල් පිළිබඳ ප්‍රකාශයක්, පී.එස්.07 ආකෘති පත්‍රය ප්‍රකාරව පවත්වා නොතිබුණි. |

**(ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල්**
**රෙගුලාසි**
**-----------------**
මු.රෙ. 1647 (ඉ)

මෝටර් වාහන ලේඛණයක් නඩත්තු කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රාදේශිය සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,292,731 ක් වූ අතර,එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,209,425ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයේ රු.1,083,306 ක වර්ධනයක් පෙන්නුම් කෙරේ.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය පිළිබඳ සමාලෝචනයක් පහත දැක්වේ.

(අ) පුනරාවර්තන ආදායම් විග්‍රහයේ දී ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී බලපත්‍ර ගාස්තු, වරෙන්තු ගාස්තු හා දඩ සහ වෙනත් ආදායම් සියයට 07 සිට සියයට 176 ක් දක්වා පරාසයක වර්ධනයක් ද සේවා සඳහා ගාස්තු සහ කුලී ආදායම් සියයට 22 සිට සියයට 55 දක්වා අඩුවීමක් ද පෙන්නුම් කරයි.

(ආ) පුනරාවර්තන වියදම් විග්‍රහයේදී ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී සැපයුම් හා උපකරණ, ප්‍රවාහන සම්බන්ධතා සහ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ හා පාරිතෝෂික යන වියදම්වල සියයට 7 සිට සියයට 20 දක්වා පරාසයක අඩුවීමක්ද, වැටුප් හා දීමනා, ගමන් වියදම්, ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියාව හා ආධාර මුදල් යන වියදම්හි සියයට 08 සිට සියයට 169 දක්වා පරාසයක වැඩිවීමක්ද පෙන්නුම් කරයි.

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂය | ඇස්තමේන්තුගත | තථ්‍ය ආදායම් | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 4,094 | 1,153 | 3,153 |
| කුලී ආදායම් | 5,285 | 3,398 | 250 |
| බලපත්‍ර ගාස්තු | 755 | 570 | - |
| සේවා සඳහා ගාස්තු | 4 | 107 | - |
| වරෙන්තු ගාස්තු හා දඩ | 1,555 | 2,297 | 917 |
| වෙනත් ආදායම් | 1,830 | 2,703 | 1,470 |

**2.3.2 වරිපනම් හා බදු**

2014 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් බදු රු.3,153,848 ක් අයකර ගැනීම සඳහා සභාව විසින් කිසිදු නීත්‍යානුකූල ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**2.3.3 මුද්දර ගාස්තු**

2014 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් මුද්දර ගාස්තු ලෙස ලැබිය යුතු රු.1,470,242 ක මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

සභාව සතු වාහන 05 ක් වර්ෂ 05 ක සිට 07 ක කාලයක් ප්‍රයෝජනයට නොගෙන සභා පරිශ්‍රය තුල ගාල්කර තිබූ අතර, ඒවා සඳහා සුදුසු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

2013 වර්ෂයේ දී ස්ථාන මාරුවී ගොස් තිබූ නිලධාරීන් 15 දෙනෙකුගෙන් අය විය යුතු එකතුව රු.55,664 ක් වූ ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

මග නැගුම ව්‍යාපෘතිය යටතේ 2014 වර්ෂයේ රු.1,500,000 වටිනා මාර්ග කොන්ක්‍රීට් කිරීමේ ව්‍යාපෘති 3 ක් සඳහා සභාව විසින් ප්‍රජා මූල මණ්ඩල සමඟ 2014 ජූලි 23 සහ 27 දිනයන්හිදී ගිවිසුම් වලට බැදී තිබුණද 2014 වර්ෂයේ වැඩ ආරම්භ කරවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබීමේ හේතුවෙන් මහා මාර්ග හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ අතිරේක ලේකම්ගේ 2015 ජනවාරි 20 දිනැති ලිපියෙන් එකී ව්‍යාපෘති අවලංගු කර තිබුණි.

## 4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

-----------------------

### 4.1 අයවැය පාලනය

------------------

සමාලෝචිත වර්ෂයේ අයවැයගත වියදම් සහ තථ්‍ය වියදම අතර සියයට 21 සිට සියයට 65 දක්වා පරාසයක විචලනයක් නිරික්ෂණය වුයෙන්, අයවැය ලේඛණය විධිමත් සඵල කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරික්ෂණ විය.

## 5. පද්ධති හා පාලනය

----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය